# මහායානයට වැට බැඳීම

මහාවංසයෙන් කියැවෙන කතාව අප තේරුම් ගන්නේ අදට සාපේක්ෂව ය. එමෙන් ම එය ලියා ඇත්තේ ද ඒ ලියූ කාලයට සාපේක්ෂව ය. අද අප ඉතිහාසයට විවිධ අර්ථකථන දෙන ආකාරයට එදා ද ඉතිහාසය විවිධාකාරයෙන් අර්ථදැක්වෙන්නට, අර්ථකථනය කෙරෙන්නට ඇත. එදා මෙරට සංස්කෘතික නායකත්වය මහාවිහාරය සතුවීය. අප සඳහන්කර ඇති පරිදි ඇතැම් යක්ෂයන් බුදුදහම වැළඳගැනීමට එතරම් මනාපයක් දක්වා නැති අතර ඔවුන් මහාවිහාරයට යම් විරුද්ධතාවක් පා ඇති බව ද පැහැදිළි ය.

අද ඇතැමුන් පවසන්නේ මහාවිහාරය දඹදිවට ගැති වූ බවත් අභයගිරිය දේශීය සම්ප්‍රදාය රැකි බවත් ය. එහෙත් ඒ ප්‍රකාශයෙහි ඇත්තේ සිංහල බෞද්ධ විරෝධයක් බව අමතක නොකළ යුතු ය. මහාවිහාරය දඹදිවට ගැති වූ බව පෙන්නුම් කළ නො හැකි ය. අශෝක රජු හා දේවානම්පිය තිස්ස රජු ගැන සඳහන් ජනප්‍රවාදයෙහි අශෝක රජු දඹදිව උපන්නේ වඩා පින් සහිත වූ නිසා බව සඳහන් වෙයි. එවැනි ආකල්ප එකල ජනප්‍රවාදයට එකතු වී ඇතැයි යන්න අපට ඉවත දැමිය නො හැකි ය. එහෙත් සිදුහත් කුමරා ද උපන්නේ දඹදිව බැවින් එකල සිංහල බෞද්ධයන් අතර දඹදිව ලංකාවට වඩා පින් බිමක් ය යන හැඟීම තිබුණි නම් ඒ ගැන කලබල විය යුතු නො වෙයි.

මහාවිහාරික භික්ෂූන් වහන්සේ කිසි දිනෙක සිංහලය දඹදිවට යටත්විය යුතු බවක් සඳහන්කර නැත. සංස්කෘතික වශයෙන් දඹදිව පින් බිමක් බව පිළිගත්ත ද දඹදිවින් බුදුදහම නැතිවී යෑම පිළිබඳ උන්වහන්සේට මනා අවබෝධයක් තිබී ඇත. බුදුදහම රැකීම සිංහල බෞද්ධයන්ගේ කාර්යභාරය කරගත්තේ ද අවසානයේ දී දඹදිව ගැන විශ්වාසයක් නොතිබූ බැවින් යැයි සිතාගත හැකි ය. මහාවිහාරය බුදුදහම ලෙස පිළිගත්තේ ථෙරවාදය බැවින් මහායානයට වැටකඩුළු බැඳීම ද උන්වහන්සේ අතින් සිදු වී ඇත.

එහෙත් එලෙස වැටකඩුළු බැඳුණු මහායානය අභයගිරිය විසින් පිළිගැණිනි. ඉන් කියැවෙන්නේ අභයගිරිය මහායානික කඳවුරක් බවට පත්වූ බව නො වෙයි. මහාවිහාරයෙහි මහායානයට ඉඩක් නොතිබුණ ද අභයගිරියෙහි එයට තැනක් දෙනු ලැබිණි. එහෙත් මහායානයට තැන දීම යනු අවසානයේ දී වෛදිකයන්ට හා වේදාන්තයට තැනක් දීම බව මහාවිහාරික භික්ෂූන්වහන්සේ දැන සිටියහ. බුදුදහම එනම් ථෙරවාද බුදුදහම ආරක්ෂා නොවුණහොත් සිංහල ජාතිය ද නැති වී යනු ඇති බව උන්වහන්සේ විශ්වාස කළ බව පෙනී යයි.

ඇතැම් යක්ෂයන් මහාවිහාරයට විරුද්ධවීම පුදුමයක් නො වෙයි. එළාර රජුගේ සේනාවේ සිංහල සෙනෙවියන් ද සිටි බව මහාවංසයෙන් ම දැනගත හැකි ය. මේ සිංහලයන් යක්ෂ ගෝත්‍රයට අයත්වී නම් අපට ඒ තේරුම්ගත හැකි ය. යම් අයුරකින් එළාර රජු ද පර්සියාවේ (ඉරානයේ) සිට පැමිණි යක්ෂ ගෝත්‍රයට අයත්වූවකු නම් මෙරට සිටි ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් සිංහල ජාතියට අයත්වුණ ද එළාර රජුට පක්ෂපාතිවීමට ඉඩ ඇත. පසු කලෙක මහාවිහාරයට විරුද්ධ වන්නට ඇත්තේ ද එවැනි යක්ෂයන් විය හැකි ය.

මහාවිහාරය දඹදිවට පක්ෂපාති වීය හා අභයගිරිය සිංහලේට පක්ෂපාතිවීය යනු එකල, මහසෙන් යුගයේ හෝ ඊට පෙර හෝ විසූ යක්ෂයන් තනාගත් ජනප්‍රවාදයක් විය යුතු ය. අප කලින් සඳහන්කර ඇති පරිදි මහාවිහාරික භික්ෂූන් වහන්සේ දඹදිවට යටත්නොවූ නමුත් උන්වහන්සේ ඒ, විශේෂයෙන් ම උත්තර භාරතය පින් බිමක් ලෙස සැළකූහ. එහෙත් කිසිවිටෙකත් ඇතැමුන් කියන ආකාරයට දක්ෂිණ භාරතයට පක්ෂපාති නො වූහ. මොවුන් මෙසේ කියන්නේ දඹදිවින් වැඩම කළ බුද්ධඝෝෂ හිමි ප්‍රධාන භික්ෂූන්වහන්සේ දෙමළ යැයි සිතමිනි. එහෙත් බුද්ධඝෝෂ හිමි ද ඇතුළු එසේ වැඩම කළ භික්ෂූන්වහන්සේ දෙමළ නොව ආන්ද්‍ර ප්‍රදේශයේ භික්ෂූන්වහන්සේ වූහ.

අද තමිල්නාඩුව යැයි කියැවෙන ප්‍රදේශයේ ථෙරවාදය පැතිරී තිබූ බවට සාක්ෂි නැත. අද තමිල්නාඩුවට අයත් කාංචිපුරය පවා එදා දෙමළ දේශයෙන් පිටත පිහිටියේ ය. බෞද්ධ ප්‍රදේශයක් වූ කාංචිපුරය මද්‍රාසි ප්‍රාන්තයට අයත්වන ලෙස දේශසීමා ලකුණු කළෝ බ්‍රිතාන්‍යයෝ ය. ඇතැම් මහාචාර්යවරු මේ කරුණු කිසිත් නොදැන වෙනත් න්‍යාය පත්‍රවලට අනුකූලව ඊනියා දෙමළ බෞද්ධ කතා කියති. සිංහලයන් සංස්කෘතික සම්බන්ධකම් පවත්වා ඇත්තේ

© Prof. Nalin De Silva

ආන්ද්‍ර ප්‍රදේශය හා වෙනත් භාරතීය බෞද්ධ ප්‍රදේශ සමග මිස ථෙරවාදී හෝ වෙනත් හෝ බෞද්ධ නොවූ දෙමළ දේශය සමග නො වෙයි.

අප කලින් කිහිප වතාවක් ම සඳහන්කර ඇති පරිදි  සිංහල භික්ෂූන්වහන්සේ ථෙරවාදයෙහි චිරස්ථිතිය සඳහා ආන්ද්‍ර ප්‍රදේශ භික්ෂූන් වහන්සේ සමග එක්ව ධර්මය පාළි භාෂාවෙන් ලියා සැලසුම් සහගත ක්‍රියා මාර්ගයක් අනුගමනයකර ඇත. ඒ දක්ෂිණ භාරතයට යටවීමක් ලෙස සැලකීම අද දවසේ බුද්ධදහම සිංහලයන්ගෙන් වෙන්කිරීමට කැසකවන්නන්ගේ න්‍යාය පත්‍රයට අනුව සිදුවන්නකි. මහාවිහාරික භික්ෂූන් වහන්සේ සොළී රටට සැමදාමත් විරුද්ධ වූහ. එළාර පවා ජනප්‍රවාදයෙහි සොළී නමින් හැඳින්වෙන්නේ ගැමුණු රජු දවස නොව පස්වැනි සියවසේ පමණ සිංහලයට සොළීන්ගෙන් වූ ගැහැට සළකමිනි. එළාර සොළී ලෙස නම්කිරීමෙන් පෙන්නුම්කෙරෙන්නේ සොළීන්ට වූ තදබල විරෝධය ය.

මහසෙන් රජු දවස ථෙරවාදය විනාශකිරීම සඳහා මෙහි පැමිණි සර්වමිත්‍ර භික්ෂුව ද මහාවිහාරවාසීන් විසින් හඳුන්වනු ලැබුයේ සොළී භික්ෂුවක ලෙස ය. මහසෙන් රජු කුමාර කාලයේ දී ම තමන්ගේ ශිෂ්‍යයකු කරගත් සර්වමිත්‍ර භික්ෂුව කුමරා රජ වූ පසු එතුමා ලවා මහාවිහාරය විනාශකිරීමට කටයුතු කළ බව සඳහන් ය. පසුව මහමේඝවර්ණ සෙනෙවියා රජුට කරුණු පැහැදිළි කිරීමෙන් පසුව මහසෙන් රජු තමන් අතින් විනාශයට පත් මහාවිහාරය නැවත ගොඩනැගීමට පියවර ගත්තේ ය. ඇතැමුන් සඳහන්කරන ආකාරයට මහසෙන් කුමරුගේ මව යක්ෂ ගෝත්‍රයට අයත් වූවා ය.

මේ සියළු කරුණුවලින් පෙනී යන්නේ මහාවිහාරය කටයුතු කර ඇත්තේ සිංහල ථෙරවාද බුද්ධදහමේ චිරස්ථිතිය සඳහා බව ය. එහෙත් අභයගිරිය ගැන කිව හැක්කේ කුමක් ද? අභයගිරිය මහායානික නොවූ නමුත් ඒ අදහස්වලට ඉඩ දුන්නේ ය. එලෙස වෙනත් අදහස්වලට ද ඉඩදීම ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවක් යැයි කිසිවකු විසින් ප්‍රකාශකරනු ලැබීමට ඉඩ ඇත. අදහස්වලට ඉඩදීම වරදක් නො වේ. එහෙත් ලෝකයේ සංස්කෘතීන් හැකිකමක් ඇත්නම් අන් සංස්කෘතික අදහස්වලට ඉඩ දෙන්නේ ඉන් තමන්ට අවැඩක් නොසිදුවන්නේ නම් ය.

අද වුව ද අරාබිකරයට බෞද්ධ පොතපත රැගෙන යෑමේ දී පනවා ඇති බාධක බොහෝ දෙනා දනිති. බටහිර රටවල ද කලකට පෙර තත්වය  එසේ විය. අද ඔවුන් ඒ ගැන එතරම් සැළකිලිමත් නොවන්නේ ඒ රටවල යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය තහවුරු වී ඇති බැවිනි. අද මෙරටින් භික්ෂූන්වහන්සේ කොපමණ බටහිර රටවලට ධර්මප්‍රචාරය සඳහා වැඩම කළත් ඒ රටවල් ථෙටවාද බෞද්ධ කිජීමට නො හැකි ය. ථෙරවාද පන්සල්වලට බ්‍රිතානි ජාතිකයෝ සාමාන්‍යයෙන් නො පැමිණෙති. එසේ පැමිණෙන ටික දෙනා ද එන්නේ භාවනාකර මානසික පීඩන හා ආතතිවලින් ගැලවීමට ය.

එහෙත් බටහිරයෝ මහායාන බුද්ධාගමට ආකර්ෂණය වෙති. එහි අන්තර්ගත භාවනාව බටහිරයන්ට වඩා ආකර්ෂණීය වෙයි. එයටත් වඩා මහායාන බුද්ධදහම හින්දු දහමටත් ඒ ඔස්සේ විවිධ ක්‍රිස්තියානි ආගම්වලටත් සමීප ය. බටහිරයන් බුද්ධදහම වැළඳගන්නේ නම් ඒ මහායාන බුද්ධදහම බව අමතක නොකළ යුතු ය. මෙහි තවත් පැත්තක් ද වෙයි. සුළු සුළු වෙනස්කම් තිබුණ ද දලයි ලාමාගේ දේශපාලනයෙන් වාසිය ලබන්නේ බටහිර රටවල් ය. එදත් අදත් චීනයට විරුද්ධව ඇමරිකානුවන් යොදාගන්නා ප්‍රධාන අවයවයක් නම් දලයි ලාමා ය. බටහිරයන්ට දලයි ලාමා ඔස්සේ ද මහායානයට හා තන්ත්‍රයානායට ආකර්ෂණයක් වෙයි.

කෙටියෙන් කිවහොත් බටහිර රටවල යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට මහායානය තර්ජනයක් නො වෙයි. එබැවින් බටහිර රටවල් මහායානයට විරුද්ධ නො වෙයි.  අද මහායානික පොතපත ඇමරිකාවේ විශාල වශයෙන් අලෙවි වන්නේ යැයි කියැවෙයි. කෙසේ වෙතත් පොතපත අලෙවි වීම බටහිර රටවලට එතරම් ප්‍රශ්නයක් නො වෙයි. අවශ්‍ය විටක එයට විරුද්ධව කටයුතුකරන්නේ කෙසේ දැයි ඔවුහු දනිති. බ්‍රිතානියේ හා පොදුවේ ගත්කල අනෙක් බටහිර රටවල ද යහපත් ප්‍රචාරයක් නොලැබෙන්නේ ථෙරවාදයට ය. ථෙරවාදයට මේ දිනවල ලැබෙන ප්‍රධානම ප්‍රචාරය ඒ දෙමළ වැසියන් පාගාගෙන සිටින සිංහලයන්ගේ ආගම බව ය. එසේත් නැතහොත් හමුදා පාලනයක් යටතේ ඇති මියන්මාරයේ ආගම බව ය. මේ ප්‍රචාරවලින් ථෙරවාදයට වන සෙතක් නොමැති බව අමුතුවෙන් කිවයුතු නො වෙයි.

© Prof. Nalin De Silva

ඒ ඒ සංස්කෘතීන් තම සංස්කෘතිය ආරක්ෂාකර ගැනීමට ක්‍රියාකරන ආකාර විවිධ වෙයි. බටහිරයන් අද එහි දී ක්‍රියාකරන්නේ ඉතා සියුම් ආකාරයකට ය. ඔවුන්ට ඇති ප්‍රධාන ම තර්ජන වනුයේ මුස්ලිම් සංස්කෘතිය හා ථෙරවාද සංස්කෘතිය ය. මුස්ලිම් සංස්කෘතිය යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය මෙන් ම ඒක දේව නිර්මාණවාදී වෙයි. ඒ හේතුව නිසා ම යුදෙව් සංස්කෘතියෙහි අනන්‍යතාව දුර්වල වෙයි. එබැවින් මුස්ලිම් සංස්කෘතියට එරෙහිව යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය යුද වදියි. ථෙරවාද සංස්කෘතිය නිර්මාණවාදී සංස්කෘතියක් නො වෙයි. එමෙන් ම ථෙරවාදී සංස්කෘතියෙන් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි පරිභෝජනවාදයට රුකුලක් නො ලැබෙයි. යම්කිසි අයුරකින් ථෙරවාදී අදහස් ලොව පුරා පැතිර ගියහොත් එයින් බටහිර ඇති වූ නූතනත්වයට හා ඒ මත පදනම් ව බිහි වූ ධනවාදයට  පහරක් වැදෙයි. ථෙරවාදී රටවලට ආර්ථික වශයෙන් අද ශක්තියක් නොතිබුණ ද තම ක්‍රමයට විකල්ප ව වෙනත් ජීවන ක්‍රමයක් ගොඩනැගීමට එහි ඇති ශක්‍යතාව පිළිබඳ අවබෝධයක් බටහිරයන්ට වෙයි. මේ සංස්කෘති දෙකට විරුද්ධව බටහිරයන් දෙයාකාරයකට යුද්ධ ප්‍රකාශකර ඇත්තේ එබැවිනි.

එදා මහායානය සම්බන්ධයෙන් ද මහාවිහාරය අනුගමනය කර ඇත්තේ ආරක්ෂණවාදී පිළිවෙතකි. මහායානයට ඉඩදීමෙන් සිංහල බෞද්ධ සංස්කෘතියට හානියක් වන බව මහාවිහාරික භික්ෂූන්වහන්සේ තේරුම්ගන්නට ඇත. එහෙත් අභයගිරි විහාරික භික්ෂූන්වහන්සේ කටයුතු කර ඇත්තේ වෙනත් ආකාරයකට ය. මහාවිහාරයේ ආරක්ෂණවාදී ප්‍රතිපත්තිය නොවන්නට මහායානය හා පසුව හින්දු සංස්කෘතිය මගින් සිංහල බෞද්ධ සංස්කෘතිය නැතිකිරීමට තිබුණි. එහෙත් එකල වැඩවිසූ අභයගිරිවාසී භික්ෂූන්වහන්සේ එසේ නොසිතා ඇති බව පැහැදිළි ය. ආන්ද්‍ර ප්‍රදේශයේ හා භාරතයේ වෙනත් ප්‍රදේශවල එකල සිදුවෙමින් පැවති ක්‍රියාදාමය අවබෝධකර ගැනීමට උන්වහන්සේ අපොහොසත් වී ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva